# සොබා දහමේ පුදබිම සල්ගල



දනයට වඩින
යෝගාවචර
භික්ෂූන් වහන්සේලා

යූ.පී.එස්. පතිරණ

**මනචාරී යුගයේ සිට ආදි කාලීන මිනිසා විසින් අව්ව, වැස්ස, ඉර, හඳ, තරු, ගස්, ගල්, පර්වත, ගංගා ආදියෙන් සැදුම් ලත් ස්වභාවධර්මය දේවත්වයෙන් පුදනු ලැබීය. ආදි කාලීන මිනිසා ජීවය හා ස්වභාවධර්මය අතර පවත්නා දැඩි සම්බන්ධතාවය අවබෝධ කර ගත් නිසාත් ස්වභාවධර්මය සතු ඉමහත් එහෙත් අදෘශ්‍ය බලය මෙන් ම සුන්දරත්වය නිසාත් ඔහු එසේ ස්වභාවධර්මය මහත් ගෞරවයෙන් සලකන්නට ඇතැයි සිතිය හැකි ය.**

දියුණු යැයි විශ්වාස කෙරෙන නූතන විද්‍යාත්මක යුගයේ ස්වාභාවික පරිසරය වනසමින් මිනිසා කොන්ක්‍රීට් වනාන්තර වලට මැදි වී මානසික අසහනයෙන් උන්මාදයට පත් වෙමින් පවතින අවස්ථාවක ජීවිතයේ දහසකුත් ප්‍රශ්න හිත් වේදනා, ළතැවුල්, ප්‍රේම වියෝග සිතින් අමතක කර දමන්නට ස්වභාවධර්මයේ සරණ පතා දිව යෑමට තැනක් ඉතිරිව තිබේනම් කොපමණ වාසනාවක් ද?

එබඳු තැනක් කලබලකාරී කොළඹ පරිසරයේ සිට සැතපුම් 43 ක පමණ නුදුරින් පිහිටා තිබීම ගැන ඔබ සමහර විට නොදන්නවා විය හැකි ය. මෙහි තුරු මුලක වාඩි වී නැතහොත් ගල්තලාවක වැතිරගෙන තුරු ලතා සිප එන මදනල ගයන සිරි සිරි නාදයත් දසතින් නැගී එන ඉමිහිරි කුරුළු නාදයත් නොනැවතී නැගෙන රැහැයි නාදයකත් මුසුවූ ස්වභාවධර්මයේ සංගීතයට දෙසවන් යොමා සිටින ඔබට එතෙක් ඔබ වෙලී ගැලී සිටි ශෝක දෝමනස්සයන් සියල්ලෙන් අත්මිදෙනු නිසැක ය.

සොබාදහම් දිනිතියගේ අසහාය නිමැවුමක් වූ මෙම වනපෙත - නැතහොත් සල්ගල වනය පිහිටියේ කොළඹ - නුවර මහා මාර්ගයේ සැතපුම් 35 ක මග ගෙවා වරකාපොල දක්වා ගොස් එතැනින් අගුරුවැල්ල පාරේ සැතපුම් හතක් දුරින් පිහිටි ගලපිටමඩ හන්දියෙන් හැරී තවත් සැතපුම් 2 1/2 ක් පමණ දුරක් ගිය විට ය. සල්ගල වඩාත් ප්‍රකට වනුයේ එහි ආරණ්‍ය සේනාසනය නිසාවෙනි. අවට වාසීන් විසින් "කැටගිල්ල මුකලාන" වශයෙන් හඳුන්වනු ලබන අක්කර 600 ක පමණ භූමි ප්‍රමාණයක් නිසා පැතිරීනු රජයේ වන රක්ෂිතයක අක්කර 10 ක පමණ භූමි ප්‍රමාණයක් සල්ගල ආරණ්‍ය සේනාසනය සඳහා වෙන්ව පවතී. සල්ගල ආරණ්‍ය සේනානසනය ආරම්භ කර ඇත්තේ 1930 වර්ෂයේදී මීදෙනියේ අදිකාරම් තුමාගේ හා ශ්‍රී නිශ්ශංක අධිතීඥතුමාගේ මූලිකත්වයෙනි.

සිංහරාජ වැනි වනාන්තරය තුළ මෙන් කුඩැල්ලන් විසින් තිනි ස්වාභාවික ආරක්ෂාව සලසාදී ඇති මෙම වන පියස තුළට යා යුතු වන්නේ ස්වභාව සෞන්දර්යය අහිංසකව විඳ දරා ගැනීමේ ඒකා-

මිනිසා කොන්ක්‍රීට් වනාන්තර වලට මැදි වී මානසික අසහනයෙන් උන්මාදයට පත් වෙමින් පවතින අවස්ථාවක ජීවිතයේ දහසකුත් ප්‍රශ්න හිත් වේදනා, ළතැවුල්, ප්‍රේම වියෝග සිතින් අමතක කර දමන්නට ස්වභාව ධර්මයේ සරණ පතා දිව යෑමට තැනක් ඉතිරිව තිබේනම් කොපමණ වාසනාවක් ද?


යත අභිලාෂය කරගත් පරිසර හිතකාමීන් පමණකැයි අවධානයෙන් සඳහන් කළ යුතුව ඇත. සල්ගල ආරණ්‍ය සේනාසනය සැදූහැවතුන් සඳහා විවෘතව ඇත්තේ පෙ.ව. 8.00 සිට පස්වරු 1.00 දක්වා පමණි.

සල්ගල ආරණ්‍ය සේනාසනයට පිවිසෙන ඔබට රිටිගල හා අරන්කැලේ යන වන සෙනසුන් වල දක්නට ලැබෙන මැනවින් සකස් කළ සක්මන් මළු ඔස්සේ පියගැටපෙළ නැග ගිය විට වාහල්කඩක් බඳු ගලින් නිමවන ලද දර්ශනීය ගල් දෙරක් හමුවන අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය මහාමාත්‍ය ඩී.ඇස්.සේනානායක මැතිඳුන් විසින් පරිත්‍යාග කරන ලද්දකි.

සල්ගල වන සෙනසුන ලෙන් 18 කින් සමන්විත වන අතර එම සියළු ගුහා සංස්කෘත නාම වලින් හඳුන්වා දී තිබේ. තපෝ වනයේ සීමා දෙරටුව වශයෙන් සැලකෙන ගල්දෙර පසු කළ විට නෙත ගැටෙන තුරු අතු මත රැඳී ලී පුවරු වල සටහන් කර ඇති ධම්ම පදයේ උපුටන තිතැතින් ම ඔබ පූජ්‍ය භූමියකට ප්‍රවේශ වූ බව සිහිගන්වයි."පිප්පලි" නමින් යුතු ප්‍රථම ලෙන දැනට හිස්ව තබා ඇත. කලින් පුස්තකාලයක් වශයෙන් පැවති "පොත්ගුල" නම් ගුහාව මෙන්ම කලින් දන ශාලාව වශයෙන් යොදා ගන්නා ලද "වෙහෙරගුහා" නම් ගුහාව ද වර්තමානයේ යෝගාවචර භික්ෂූන් වහන්සේලාගේ ලෙන් වශයෙන් යොදාගෙන තිබේ.

පර්වත, ගල්ගුහා හා වෘක්ෂලතාදියෙන් සමන්විත සල්ගල ඓතිහාසික පසුබිම වලගම්බා රජ දවස (ක්‍රි. පූ. 103) තෙක් දිවේ. වලගම්බා රජුගේ ඇමතිවරුන් වශයෙන් සැලකෙන තනසිව හා මහානාග යන දෙදෙනා විසින් මෙහි කටාරම කුළ ලෙන් දෙකක් මහා සංඝයා වහන්සේ වෙනුවෙන් පූජා කර තිබේ.චෝල ආක්‍රමණයන් හමුවේ අනුරාධපුරය අතහැර පළාවිත් දිවයිනේ තැනින් තැන සැඟ වී ආරක්ෂාව සලසා ගත් වලගම්බා රජු තම ආරක්ෂාව සලසා ගත් එක් ස්ථානයක් ලෙසට සල්ගල සැලකේ. "මෙහි ඇතා බැඳි හෙල"නමින් හැඳින්වෙන ගල් කුල වලගම්බා රජතුමාගේ ඇතා බැඳ සිටි ගල් කුල ලෙස විශ්වාස කෙරේ. තවද, සල්ගල වනයේ දක්නට ලැබෙන "බැලුම්ගල" වලගම්බා රජුගේ සෙබලුන් රැකවලෙහි යෙදී සිටි ස්ථානයක් ලෙස ද සැලකේ. මෙම බැලුම්ගල මත සිට අවට පරිසරය මැනවින් පරීක්ෂා කර බැලිය හැකි හෙයින් මෙය ආරක්ෂක මුරපොලක් සේ සලකන්නට ඇත. මෙහි සිට එක් පසෙකින් ශ්‍රී පාද ස්ථානයත් අනෙක් පසින් මහ මුහුදත් දර්ශනය කළ හැකි දැකුම්කළු ස්ථානයකි.

දේශීය ජනයා විසින් වනයේ වටිනා ඖෂධ පැළෑටි හා මල් පැළෑටි ඉවත් කර ගෙන යාම හා සමහර අවස්ථාවල දී වනය තුළට පැමිණෙන පෙම්වතුන්ගේ හා තරුණ කොටස්වල අසංවර හැසිරීම් නිසා ද සල්ගල වනයේ පරිසර පද්ධතියට එල්ල වී ඇති තර්ජනයන් සුළුකොට තැකිය යුතු නොවේ.



**සල්ගල විරල ගනයේ සමනල විශේෂ 30 කට ප්‍රකට ය.**

මඳක් දුෂ්කර ගමනකින් ළඟා විය හැකි "ගිජ්ජකූඨ" ලෙන වලගම්බා රජ කලක් රැඳී සිටි ස්ථානයක් ලෙස සැලකේ. මෙහි ඇති සෙල් ලිපියේ එම ලෙන භාතෘ ධර්මගුප්ත මහ රහතන් වහන්සේට වලගම්බා රජ විසින් පූජා කළ බව දැක්වේ. මෙහි අක්ෂර අශෝක අක්ෂර හා සමීප වන හෙයින් එහි කාල වකවානුව ක්‍රි.පූ දෙවන ශතවර්ෂය ලෙස විශ්වාස කෙරේ. "බාතදම ගුනලෙන" වශයෙන් හැඳින්වෙන මෙම ලෙන වර්තමානයේ බුදු මැදුරකි. විශාල පර්වත ගුහාවක් වන ගිජ්ජකූඨ ලෙන ආසන්නයේ දඹදිව සිට මෙහි ගෙනවුත් රෝපණය කරන ලද ආනන්ද බෝධි ශාඛාවක් ද වේ.

සල්ගල හා ඒ ආසන්නයේ පිහිටි ලෙනගල වලගම්බා රජ විසින් උමගක් මගින් සම්බන්ධ කළ බව කියැවේ. අද ද එම උමං දෙරකඩ දැක ගත හැකි අතර හදිසි අවස්ථාවකදී වලගම්බා රජුට සැඟවී පලා යාමට යොදා ගැනීම සඳහා එම උමග තැනූ බව විශ්වාස කෙරේ.

පෞරාණිකත්වයත්, පූජනීයත්වයත් එක් වූ සල්ගල වනය ජෛව විවිධත්වයෙන් ද පොහොසත් පරිසර පද්ධතියක් ලෙස ද සැලකිය හැකි ය. සල්ගල වනයේ අඩි 100 කට වඩා උස්ව හා ඝනව වැඩුණු විශාල වෘක්ෂයන්ගෙන් ද සමන්විත වන අතර, ඉන් වට හැටේ ගස යැයි හැඳින්වෙන මුගුණු ගස අද ප්‍රධාන සංචාරක ආකර්ෂණයක් බවට පත් වී තිබේ. ආර්ථික වටිනාකමෙන් යුතු ශාක ද ඇතුළත් මිල්ල, පිහිඹිය, ඇට හෙරලිය, හල්, නැඳුන්, ගොඩපර දියනාලිය වැනි ශාක විශේෂ මෙන්ම ඉරරාජ, සඳරාජ, කුඩා හැඩය හා මහා හැඩය වැනි වටිනා ඖෂධ පැළෑටි වලින් ද සරුසාර වී තිබේ. සල්ගල වනය විරල ඝනයේ සමනල විශේෂ 30 කට මෙන්ම පක්ෂි විශේෂ හා උරග විශේෂ රැසකට ද නිජබිම වී ඇත. ශ්‍රී ලංකාවට ආවේණික ලංකා වලිකුකුලා, ලංකා ගිරා මලින්තා, ලංකා හබන් කුකුලා, ලබු ගිරවා, කුරුළුගොයා වැනි පක්ෂි විශේෂ මෙහිදී හොඳින් නිරීක්ෂණය කළ හැකි ය. සල්ගල වනයේ සැරිසරන ක්ෂීරපායීන් අතරට වැලිමුවා, මීමින්නා, හාවා, වල් ඌරා, මුගටියා, දඬුලේනා මෙන් ම දැනට වඳවී යාමේ තර්ජනයට මුහුණ පා ඇති දියබල්ලා හා කොළ දිවියා ද ඇතුළත් වේ.

සල්ගල ආරණ්‍ය සේනාසනයට දිනපතා දනමානාදිය දීමටත්, භාවනායෝගීව සිටීමටත්, භික්ෂූන් වහන්සේලා හමු වී බණ භාවනා ඉගෙනීමටත් පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යමින් පවතී. සල්ගල වනයේ අනාගත සුරක්ෂිතභාවය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී පොදුවේ ශ්‍රී ලංකාවේ අනෙකුත් පරිසර පද්ධතීන්වලට බලපාන ගැටළු හා සමානව තර්ජනයන් රැසකට ද මුහුණ දීමට සිදුවී ඇති බව පෙනී යයි. හොරසුරා ජාවාරම්කරුවන්, දඩයම්කරුවන් හා දැව හොරුන් නිදැල්ලේ වනය තුළ කටයුතු කිරීම දේශීය ජනයා විසින් වනයේ වටිනා ඖෂධ පැළෑටි හා මල් පැළෑටි ඉවත් කර ගෙන යාම හා සමහර අවස්ථාවල දී වනය තුළට පැමිණෙන පෙම්වතුන්ගේ හා තරුණ කොටස්වල අසංවර හැසිරීම් නිසා ද සල්ගල වනයේ පරිසර පද්ධතියට එල්ල වී ඇති තර්ජනයන් සුළුකොට තැකිය යුතු නොවේ.

කෙසේ වුවද, එබඳු තර්ජනයන් ඔස්සේ සල්ගල වනයේ පූජනීයත්වය හා පාරිසරික තුල්‍යතාව සුරැකීම සඳහා පරිසර හිතකාමී සියළු ජනතාවන් පෙරමුණ ගැනීමේ කාලය දැන් පැමිණ ඇති බව අවසාන වශයෙන් සඳහන් කළ යුතු ය.